# SHARE MARKET

## කොටස්

සමාගමක ආරම්භක ප්‍රාග්ධනය, ඒකකයක් ලෙස සලකා එය සමාන කොටස්වලට හෙවත් පංගුවලට බෙදූ විට ඉන් එක් පංගුවක් එක් '**කොටසක්**' ලෙස හැඳින්වේ.

## කොටස් සඳහා ලාභාංශ

ලැයිස්තුගත සමාගම්, සිය ආරම්භක කොටස් නිකුත් කිරීමේ දී ම සමාගමේ ලාභයෙන් කොටස්කරුවන් සඳහා ප්‍රතිලාභ ලෙස නිකුත් කරන මුදල් ප්‍රමාණය නිවේදනය කරයි. එය එක් කොටසක් සඳහා ගෙවන මුදල මගින් දැක්වේ. එසේ ගෙවන මුදල් වාර්ෂික ව හෝ කාර්තු වශයෙන් හෝ ගෙවනු ලබන අතර, ඒවා '**ලාභාංශය**' ලෙස හැඳින්වේ

ClassWork.LK

## කොටසක ගැණුම් මිල සහ කොටසක විකුණුම් මිල

සමාගමක කොටස් එහි හඳුන්වා දීමේ මිලට හෝ වෙළෙඳපොළ මිලට හෝ මිල දී ගත් විට එම මිල කොටසක **ගැණුම් මිල** ලෙසත් එම කොටස්, වෙළෙඳපොළ මිලට විකුණානු ලබන මිල කොටසක **විකුණුම් මිල** ලෙසත් හැඳින්වේ.

## ප්‍රාග්ධන ලාභය

විකුණුම් මිල > ගැණුම් මිල නම්, එවිට ප්‍රාග්ධන ලාභයක් ලැබෙන අතර,

**ප්‍රාග්ධන ලාභය = කොටස්වල විකුණුම් මිල - කොටස්වල ගැනුම් මිල**

ClassWork.LK

විකුණුම් මිල < ගැනුම් මිල නම්, ප්‍රාග්ධන අලාභයක් සිදු වන අතර,

**ප්‍රාග්ධන අලාභය = කොටස්වල ගැනුම් මිල - කොටස්වල විකුණුම් මිල**

ClassWork.LK

ClassWork.LK